# විශ්වවිද්‍යාලයීය වෘත්තීය සමිති ඒකාබද්ධ කමිටුව
# University Trade Union joint Committee


සම සභාපතිවරු

පී.එච්.ඩී.එස්. ප්‍රියන්ත
වෛද්‍ය පීඨය
රුහුණු විශ්වවිද්‍යාලය
071-4450507

එම්.ඩී. දාබරේරා
වෛද්‍ය පීඨය
කැළණිය
විශ්වවිද්‍යාලය
071- 4464650

සම ලේකම්

ජනක විමලසූරිය
ශ්‍රී ජයවර්ධනපුර
විශ්වවිද්‍යාලය
071-6811263

පී.කේ. රුවන් කුමාර
පේරාදෙණිය
විශ්වවිද්‍යාලය
071 -4446753

භාණ්ඩාගාරික

ප්‍රියන්ත වීරසූරිය
පේරාදෙණිය
විශ්වවිද්‍යාලය
076-1735559

Joint Presidents

P.H.D.S. Priyantha
Faculty of Medical Science
University of Ruhuna
071-4450507

M.D. Dabarera
Faculty of Medical Science
University of Kelaniya
071-4464650

Joint Secretary

Janaka Wimalasuriya
University of Sri Jayewardenepura
071-6811263

P.K. Ruwan Kumara
University of Peradeniya
071-4446753

Treasure

Priyantha Weerasuriya
University of Peradeniya
077-9024612


2022.04.25

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග මහතා
සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

**දීප ව්‍යාප්ත මහා වැඩ වර්ජනය - 2022 අප්‍රේල් 28**

දිවයින තුළ සියලුම ජනතාවට ඇති වී තිබෙන අතිශය පීඩාකාරි තත්ත්වය මත මේ වන විට ආරම්භ කර ඇති ජනතා අරගලයට සහය පල කිරීමට සමස්ත පොදු ජනතාව නියෝජනය කරනු ලබන වෘත්තීය සමිති සහ බහුජන සංවිධාන එක්ව අප්‍රේල් 28 වන දින දීප ව්‍යාප්ත එක් දින මහා වැඩ වර්ජනයක් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

අද වන විට රාජ්‍ය සේවය, අර්ධ රාජ්‍ය සේවය හා පෞද්ගලික සේවක හවතුන් සහ එදිනෙදා රැකියා කටයුතුවල නියැළෙන වෘත්තීන්වල සේවය කරනු ලබන සියලුම අංශවල සේවක හවතුන් දිවයිනේ පවතින දැඩි උද්ධමනය හේතුකොට ගෙන දැඩි ආර්ථික හා මානසික අර්බුදවල සිරවී ඇත. දිනෙන් දින ඉහළ යන තෙල් මිල, ගෑස් මිල, ප්‍රවාහන ගාස්තු, කිරිපිටි මිල, අත්‍යවශ්‍ය ආහාර සහ ඖෂධ මිල මෙන්ම ඒවා නිසි ලෙස වෙළඳ පොළට සැපයීමට නොහැකි වීම දිගින් දිගටම සිදු වෙමින් පවතී. තවද ජන ජීවිතයට සෘජුවම බලපාන සේවාවන්වලට අදාළ සිමෙන්ති සහ අනෙකුත් වානේ, යකඩවල මිල ගණන් ඉහළ යාම ද අසාමාන්‍ය තත්ත්වයක් ඇති කරමින් ජන ජීවිතයට මරු පහරක් එල්ල කර ඇත. සාමාන්‍ය ආහාර වේලක මිල මෙන්ම පාන් ගෙඩියේ සිට සියලු ආහාර ද්‍රව්‍ය ඉහළ යෑම තුළ ඇති වී තිබෙන දරිද්‍රතාවය තවදුරටත් උසුලා ගැනීමට සමස්ත ජනතාවට අපහසු වී ඇත.

එමෙන්ම, විශ්වවිද්‍යාල ප්‍රජාවට බලපාන වෘත්තීය ගැටලු සම්බන්ධව 2022 මාර්තු 11 වන දින ගරු අධ්‍යාපන අමාත්‍යතුමා සමඟ පැවති සාකච්ඡාවේදී එම ප්‍රධාන ගැටලුව විසඳීම සඳහා අදාළ පාර්ශවයන් සම්බන්ධීකරණය කරමින් සාකච්ඡා පැවැත්වීමේ වගකීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පවරන ලදී. එසේ වුවද එකඟ වූ පරිදි සිංහල හින්දු අලුත් අවුරුද්දට පෙර කිසිදු සාකච්ඡාවක් සංවිධානය කිරීමට ඔබ පාර්ශවය අසමත් විය. එබැවින් විශ්වවිද්‍යාල ප්‍රජාව හා වෘත්තීය සමිති නායකයින් දැඩි කළකිරීමකට හා නොසන්සුන්තායට පත්ව ඇත.

එම නිසා මෙම සියලු කරුණු පදනම් කර ගනිමින් විශ්වවිද්‍යාල ප්‍රජාවගේ ගැටලු විසඳීමට කටයුතු නොකිරීමත් මේ වනවිට රටෙහි පවත්නා දැඩි ආර්ථික අර්බුදකාරී තත්ත්වයත් සම්බන්ධව විශ්වවිද්‍යාල අනධ්‍යයන වෘත්තීය සමිති සියල්ල 2022.04.25 වන දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව පහත එකඟතාවයට එළඹුණි. එනම්,

2022 අප්‍රේල් 28 වන දින සමස්ත විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලය දීප ව්‍යාප්ත එක් දින සංකේත වැඩ වර්ජනයට සහය පළ කරමින් වැඩ වර්ජනයක නියැළීමට තීරණය කරන ලදී.

රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ පරිපාලනමය නොවන සියලු වෘත්තීය සමිති අණ පරිදි,

(පී.එච්.ඩී.එස්. ප්‍රියන්ත/එම්.ඩී. දාබරේරා)
සම සභාපතිවරු

(ජනක විමලසූරිය/ පී.කේ. රුවන් කුමාර)
සමලේකම්වරු

පිටපත් ඃ 1. ලේකම්තුමා, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය.
2. ලේකම්තුමා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.
3. විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්/ආයතන අධ්‍යක්ෂවරුන්/ මණ්ඩාධිපතිවරුන්/ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන ලේඛකාධිකාරීවරුන්/ නියෝජ්‍ය ලේඛකාධිකාරීවරුන්